# හැඳින්වීම හා පර්යේෂණ ක්‍රමවේදය

මුල් බුදුසමයෙහි අවධාරණය වන සෞන්දර්යය පිළිබඳ ආස්ථානය සම්බන්ධයෙන් විමසන විට පැහැදිලි ලෙස ම ගෙනහැර දැක්විය හැකි කරුණක් නම් උද්‍යෝගිමත් නොඑසේ නම් ක්‍රියාශීලී ජීවන ප්‍රවෘත්තියකට එමගින් මග සලසන බව  ය. සමාජයේ දක්නට ලැබෙන නානාවිධ ආරම්මණයන් හමුවෙහි අතිධාවනයෙහි නොයෙදීම මෙන් ම සීමාතික්‍රාන්ත ලෙස ඒ කෙරෙන් විනිර්මුක්ත නො වීම ද එහි අවධාරිත ය. ඒ බව  ඛග්ගවිසාණ සූත්‍රයෙහි ,**යෝ නාච්චසාරී න පච්චසාරී සබ්බං අච්චගාමා ඉමං පපඤ්චං, සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං,** යනුවෙන් ප්‍රකාශ වෙයි.( සුත්තනිපාත, පිටුව, 04.) තෙකිච්ඡකානි ථෙරගාථාව අවධාරණය කරන්නේ ප්‍රීතියෙන් නො තොරව ඔද වැඩුණු මනසින් යුක්ත ව වාසය කිරීම ඉතා උචිත බවයි. (පීතියා ඵුට සරීරෝ හොහිසි සතතමුදග්ගො)(ථෙරගාථා, පිටුව,382.) ප්‍රීතිය හා ප්‍රමෝදය මිනිස් ජීවිතය වඩාත් සාර්ථක කොට ගැනීමට මග පෙන්වයි. මෙම උදාරතර චෛතසිකයන්ගෙන් තොර ජීවිත බොහෝ සෙයින් අතෘප්තිකර ද සමාජ විරෝධී ද වෙයි. මුල් බුදුසමය අවධාරණය කරන්නේ මෙකී ප්‍රීති ප්‍රමෝදය ධර්මානුකූල විය යුතු බව ය. (ධම්මූපසංහිතං පාමුජ්ජං). ප්‍රමෝදවත් මනසක් හිමි තැනැත්තාහට ප්‍රීතිය උපදින බව ද (පමුදිතස්ස පීති ජායති) ප්‍රීතියෙන් යුක්ත මනසක් ඇති තැනැත්තාගේ භෞතික ශරීරය සුවපත් වන බව ද (පීතිමනස්ස කායො පස්සම්භති) එය අනුක්‍රමයෙන් චිත්තේකාග්‍රතාව සඳහා ඉවහල් වන බව ද එහි දැක්වේ. සෞන්දර්යාත්මක චින්තනයෙහි උපයෝගීතාව ඇති වන්නේ මෙම සන්දර්භයේ දී ය. ( මජ්ඣිම නිකාය I, පිටුව,88. )

සළායතන වග්ගයේ මාලුංක්‍යපුත්ත සූත්‍රය ඉහත දැක්වූ සන්දර්භයට අදාළ බෞද්ධ ආස්ථානය විශදීකරණය කරයි. ඒ අනුව සිහියෙන් තොර වී (සතිමුට්ඨා)

ආදානග්‍රාහී ලෙස (පියං නිමිත්තං මනසිකරොතෝ) රාගයෙන් යුක්තව බාහිර පරිසරයෙහි සාධක වින්දනය කරන්නා (සාරත්තචිත්තෝ වේදේති) අන්තගාමියෙකි. සෞන්දර්යය රසාස්වාදයේ දී ඇති විය යුත්තේ මීට හාත්පසින් වෙනස් වූ අධ්‍යාශයකි. එනම් මනා සංයමයකින් යුක්තව හා (පතිස්සතො) ආදානග්‍රාහී දෘෂ්ටියෙන් සපුරා විනිර්මුක්ත ව (විරත්තචිත්තො වේදේති) ය. සෞන්දර්යය වින්දනය කිරීමේ දී සිතින් අත් විඳිනු ලබන මනාපකාරී ප්‍රසන්න භාවයන් (සෙවතො චාපි වේදනං) විරත්තචිත්තයෙන් හෙවත් නො ඇලුණු සිතින් සිදුවන්නක් හෙයින් ක්ලේෂ දූරීකරණය සඳහා මිස රාශීකරණය සඳහා නොවේ. (ඛීයති නොපචීයති). එය ම ඔහු ඉතා සුසංවේදී මනා පෞරුෂ සම්පන්න අයකු බවට පත් කරයි (එවං සෝ චරතී සතෝ).මෙසේ සංසුන් සුසංවේදී මනසකට හිමිකම් කියන්නා නිවනට සමීප වෙයි (අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං). (සංයුක්ත නිකාය ෂඩ්ල පිටු,158-160.) මුල් බුදුසමයෙහි විද්‍යමානවන සෞන්දර්යාත්මක ප්‍රවේශයන් අර්ථවත් වන්නේ මෙම පදනමෙහි සිට ය.

## අධ්‍යයන ගැටලුව

ආදි බුදුසමයේ එන සෞන්දර්යය හා සබැඳි ඇතැම් වියතුන්ගේ සාවද්‍ය මත පෙන්වා දී ඒ උදෙසා බුදුදහම දක්වන නිවැරදි ආකල්පය කවරාකාරදැයි ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍යාර්ථය යි. සෞන්දර්යයේ සහ කලාවේ නාමයෙන් සමාජය දූෂණය කරමින් සෞන්දර්යය ඇගයීම යනු කාමයන්ට වසඟ වීමය යන වත්මන් නිර්දය ප්‍රතිපදාවට ප්‍රතිපක්ෂ ව, බුදුදහම කාමයන්ට වසඟ නො වී සෞන්දර්යය අගයන්නේ කවරාකාරයෙන් ද යන ගැටලුව නිරාකරණය කර ගැනීමේ ප්‍රෝත්සාහය මෙහි දී අප විසින් සිදුකොට තිබේ .

හැම බොදුනුවකුගේ ම ආවසානික අභිමතාර්ථය නිර්වාණාධිගමය යි. එය සාක්ෂාත් කිරීම උදෙසා තමා ඇතුළු විශ්වයේ සකලවිධ සංස්කාර ධර්මයන් අනිත්‍ය,

දුක්ඛ හා අනාත්ම වශයෙන් අවබෝධ කරගත යුතු වෙයි. මෙවැනි සන්දර්භයක් තුළ බෞද්ධයෙකු සෞන්දර්යය වැනි ප්‍රස්තුතයක් කෙසේ අගැයුමට ලක් කළ යුතු ද යන්න ගැටලුවක් සේ පෙනීම පුදුමයක් නොවේ.

බුදුසමය වූකලී පරාජිත අකර්මණ්‍ය, අජීවී දර්ශනයක් යැයි සමහරුන් කරන සාවද්‍ය චෝදනාවට හේතු වන්නේ බුදුසමයෙහි ඒක දේශයක් පමණක් අධ්‍යයනය කිරීම නිසාවෙනි. අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම සංඥාව වැඩීම යනු ලෝකය දෙස අක්‍රිය උදාසීන ආකල්පයකින් බැලීම ද? බොදුනුවකු නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි ගමන් කළ යුත්තේ පරාජිත අසරණ වූ මානසික ආකල්පයකින් යුතුව ද? නැත්තේම ය. බොදුනුවකු ලෝකය පිළිබඳව ඇතිකර ගත යුත්තේ සුබවාදී ප්‍රබෝධමත් ආකල්පයකි. නිවන් මඟ පසක් කළ යුත්තේ දැඩි අධිෂ්ඨාන පූර්වක පධන් විර්යය වැඩීමෙනි.

උක්ත ගැටලුව නිරාකරණය කිරීමෙහි ලා සප්‍රමාණික නිදසුන් මූලික බුදුසමයේ එන සූත්‍ර දේශනා තුළින් ගෙනහැර දක්විමට ප්‍රෝත්සාහී වීමි. සෞන්දර්යයෙහි මූලිකාංගයන් වන කවිය, ගීතය, සංගීතය, චිත්‍ර කලාව, නෘත්‍යය, පාරිසරික වර්ණනා වැනි ප්‍රධාන ප්‍රස්තුතයන් පිළිබඳව බුදුරදුන්ගේ තියුණු විමසීම් හා ඇගයීම් වෙසෙසින් සූත්‍ර පිටකය පුරා විසිර පවතී. බුදුරදුන් පමණ ස්වභාව සෞන්දර්යයේ චමත්කාරය වර්ණනා කරමින් ස්වීය ධර්ම පණිවුඩය ප්‍රකාශයට පත්කිරීම සඳහා ස්වභාව සෞන්දර්යයේ හුරුබුහුටි ව්‍යක්ත උපමා ගෙනහැර පෑ අන් ශාස්තෘවරයෙකු කැල ම නැත්තේ ය.

ලොව විචිත්‍රත්වය සදාකල්හි විද්‍යමාන වේ. මිනිසා කාමයෙහි විචිත්‍රත්වයෙන් ඇලීම ලෞකික සෞන්දර්යය වශයෙන් සැලකේ. නුවණැත්තා කාම වස්තූන් එසේ තිබිය දී ඒවායෙහි නොඇලෙන බව අංගුත්තරනිකායේ නිබ්බේධික සූත්‍රයේ දී බුදුරදුන්

කරන ප්‍රකාශය සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ ඉතා ගාම්භීර ඓතිහාසික විශ්ලේෂණයකි. මෙමගින් බුදුරදුන් අනුදන වදාරා ඇත්තේ ඕලාරික නො වූ අලාමක සෞන්දර්යය රසාස්වාදයට අවැසි වූ දාර්ශනික පසුබිම යි.

## අධ්‍යයනයේ අරමුණු

පූර්වොක්ත ප්‍රස්තුතයන් සාධනය කිරීම මෙම පර්යේෂණයේ මූඛ්‍යාර්ථය වන අතර, විශ්වයේ හාත්පස පැතිර පවත්නා රමණීයත්වය ඉඳුරන් මඟින් ස්පර්ශ කරමින් ඒවායෙහි ඇලීම දාහය ජනිත කරයි. ඒ වනාහී දුකට හා ආපත්තියට ප්‍රත්‍ය වේ. වින්දනයේ පරිපූර්ණත්වය අලාමක අනුපාදාන වූ මානසික අනුභූතියකි. මෙලෙසින් උසස් තලයක මානසික වින්දනයක් අත්විඳිය හැක්කේ සකල ක්ලේශයන් ප්‍රහීණ කළා වූ වීතරාගී උතුමෙකුට පමණි. ථේර-ථේරී උදානයන් අතර විද්‍යමාන පාරිසරික වර්ණනා වලින් ප්‍රකාශ වන්නා වූ එම ආර්ය උතුමන් අත්විඳින ලද නිරාමිස ප්‍රීතිය කවරක් ද යන්න මතුකොට දැක්වීම මෙහි ප්‍රධාන අභිප්‍රාය යි.

ආදි බුදුසමයෙහි එන සෞන්දර්ය සංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කෙරෙන මෙම නිබන්ධයේ පහත සඳහන් අරමුණු ද සාධනය කර ගැනීම අභිමත යි.

- සෞන්දර්යාත්මක ලක්‍ෂණ අන්තර්ගත පාලි මූලාශ්‍ර හඳුනාගැනීම
- බුදුරදුන් අනුදත් සෞන්දර්ය රසාස්වාදයේ ස්වරූපය හඳුනාගැනීම
- ගීතය හා සංගීතය පිළිබඳ බුදුරදුන්ගේ ආකල්ප කෙබඳුදැයි හඳුනාගැනීම
- පුද්ගල ආධ්‍යාත්මික සුවය සඳහා බෞද්ධ සෞන්දර්යයේ උපයෝගීතාව සාකච්ඡා කිරීම
- පාරිසරික සෞන්දර්යය පිළිබඳ දාර්ශනික හා මනෝවිද්‍යාත්මක හරය ඉස්මතු කිරීම, යනු එහි ප්‍රධාන අරමුණු යි.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා අනුගමනය කරනු ලබන ප්‍රධාන ක්‍රමවේදයන් වන්නේ මූලාශ්‍ර අධ්‍යයනය (Study of Sources) හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview Method) යි. මෙහි දී අධ්‍යයනය කරනු ලබන මූලාශ්‍රයයන් ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍ර, ද්විතීයික මූලාශ්‍ර හා තෘතීයික මූලාශ්‍ර වශයෙන් තෙවැදෑරුම් වේ.

මෙහි දී අභිමත මාතෘකාව විග්‍රහ කිරීමෙහි ලා ප්‍රධාන වශයෙන් ආදි බුදුසමයට අයත් මූලික ත්‍රිපිටක ග්‍රන්ථ බහුල වශයෙන් පරිශීලනය කෙරුණු අතර, උක්ත ප්‍රස්තුතය තහවුරු කිරීම සඳහා ද්විතීයික හා තෘතීයික මූලාශ්‍ර මෙන් ම සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද භාවිත කෙරිණ. එසේ ම ආන්තික සටහන් හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සැකසීමේ දී භාවඩ් විශ්වවිද්‍යාලයීය නූතන සම්ප්‍රදායය අනුගමනය කෙළෙමි. ඒ ඒ පරිච්ඡේදවල දී භාවිත කළ මූලාශ්‍ර ග්‍රන්ථ ආන්තික සටහන් ලෙස සෑම පරිච්ඡේදයක් අවසානයේ දී සංක්ෂේපයෙන් දක්වා ඇති අතර, එහි විස්තරාත්මක ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු (Bibliographic Data) ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියේ දක්වා ඇත.